සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2019

# ක්‍රිස්තු ධර්මය

06 ශ්‍රේණිය | කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

## I කොටස

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ජේසුස් වහන්සේගේ උපත දේවදූතයින් මුලින්ම දැනුම් දුන්නේ,

(1) ගොවීන්ට ය. (2) එඬේරුන්ට ය.

(3) ශාස්ත්‍රවන්තයින්ට ය. (4) සාමාන්‍ය ජනතාවට ය.

02. ස්නාවක ජොහාන්තුමාගේ දෙමාපියන් වන්නේ,

(1) මරියා හා ජෝසෙප් ය. (2) හන්නා හා එල්කානා ය.

(3) ආබ්‍රහම් හා සාරා ය. (4) එළිසබෙත් හා සෙකරියස් ය.

03. ජේසු කුමරු දෙමාපියන් සමඟ දෙව් මැදුරට ගිය මංගල්‍යය වන්නේ,

(1) පාස්කු ය. (2) කූඩාරම් ය.

(3) නත්තල් ය. (4) සංවත්සර ය.

04. ජුදෙව්වරුන් බැබිලෝනියට පිටුවහල් කළ විට සමාරියට පැමිණ පදිංචි වූ කණ්ඩායම හඳුන්වන්නේ,

(1) ජුදෙව්වරු ලෙසය. (2) බැබිලෝනියන්වරු ලෙසය.

(3) සමාරිතවරු ලෙසය. (4) විනයධරයන් ලෙසය.

05. පැළයක් සිටුවීමෙන් දේව මැවිල්ලට ඔබ දායක වන්නේ,

(1) වර්ෂාව ලබා දීම සඳහා ය.

(2) මනුෂ්‍යයෙකු ලෙස තම වගකීම ඉටු කිරීම සඳහා ය.

(3) මැවිල්ල වැඩි වර්ධනය කිරීම සඳහා ය.

(4) පරිසරය අලංකාර කිරීම සඳහා ය.

- **අංක 06 සිට 10 දක්වා දැක්වෙන ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (X) ලකුණ ද යොදන්න.**

06. ජේසුස් වහන්සේ වයස අවුරුදු දොළහේ දී මරියතුමිය හා ජෝසෙප්තුමා සමඟ ජෙරුසලම් දේවමාලිගාවට ගිය සේක. ( )

07. ජේසුස් වහන්සේගේ කුරුසිය උසුලාගෙන යෑමට කිරේනියේ සීමොන් උදව් විය. ( )

08. පසුතැවිලි වීමේ බෞතිස්මය ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ජොර්දාන් නදියේදී ලබා දුනි. ( )

09. අපගේ ජීවිත නිවැරදි කරගෙන පාපයෙන් මිදී ජීවත් වීම කිතුණු අපගේ වගකීමයි. ( )

10. අපගේ ජීවිතයේ ගැටලු ඉදිරියේ ඇදහිල්ලට වඩා ලකුණු හා හාස්කම් විශ්වාස කළ යුතුයි. ( )

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට A කොටසේ ඇති ප්‍රකාශ කවුරුන් විසින් කියන ලද්දේ දැයි B කොටසින් තෝරා යා කරන්න.**

| | |
|---|---|
| 11. 'දාවිත්ගේ පුත් ජේසුස් වහන්ස මට අනුකම්පා කරන්න.' | එතියෝපීය ජාතිකය |
| 12. 'මාගේ අසල්වැසියා කවුද?' | දේවදූතයා |
| 13. 'යමෙක් මඟ පෙන්නුවොත් මිස මට තේරුම්ගත හැක්කේ කෙසේද?' | විනයධරයා |
| 14. 'මිනිසා කෑමෙන් පමණක් ජීවිත් නොවේ යැයි ලියා තිබේ.' | බාර්තිමෙයස් |
| 15. 'උන්වහන්සේ මෙහි නැත. උන්වහන්සේ කී ලෙසම නැගිටුනු සේක.' | ජේසුස්වහන්සේ |

- **අංක 16 සිට 20 දක්වා ප්‍රකාශවල දැක්වෙන ප්‍රකාශ වල හිස්තැන තුලදී ඇති පිළිතුරු යොදා ගනිමින් සම්පූර්ණ කරන්න.**

ඒදන් / ක්ලේයෝපස් / ස්තේපන් / පිලිප් / උත්පත්ති

16. විජාතිකයකු වූ එතියෝපීය මිනිසාට දේව පණිවිඩය ලබා දුන්නේ ........................................................ තුමාය.

17. දෙවියන් වහන්සේ ................................................................ උයන නිර්මාණය කර ආදම් හා ඒවට භාර දුනි.

18. මැවීම පිළිබඳ ශුද්ධ බයිබලයේ සඳහන් වන්නේ ........................................................................ පොතෙහි ය.

19. එම්මාවුස් ගමනට සම්බන්ධ වූ ගෝලයෙක් ලෙස ............................................................... පෙන්වා දිය හැක.

20. උපස්ථායකයින් අතර මූලිකයා වූයේ ............................................................................................. තුමා ය.

(ල. 2x20 = 40)

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**
- **කෙටි පිළිතුරු සපයන්න.**

01. (i) දේව මැවිල්ලේ මුදුන් මල්කඩ ලියා දක්වන්න.
  (ii) ජුදා ව්‍යවස්ථාවට අනුව පිරිමි දරුවෙකු වැඩිහිටියෙකු ලෙස පිළිගන්නේ කිනම් වයසකදී ද?
  (iii) ජේසු කුමරු හඳුනා ගැනීමට එඬේරුන්ට දුන් සලකුණ කුමක් ද?
  (iv) ජේසුස් වහන්සේගේ කුරුසිය මත සටහන් කළ තිබූ ප්‍රකාශය කුමක්ද?
  (v) ජේසුස් වහන්සේ උත්ථාන වූ දිනය හඳුන්වන නම කුමක්ද?
  (vi) ගෝලයන්ට ශුද්ධාත්ම දානය ලැබූ දිනය හඳුන්වන්නේ කුමන නමකින් ද?
  (vii) ජුදෙව් පාස්කු මංගල්‍ය යනු කුමක්දැයි හඳුන්වන්න.
  (viii) 'මා පියාණන්ගේ ගෘහයේ සිටිය යුතු බව ඔබ නොදන්නාහුද?' කවුරුන් විසින් කා හට කියන ලද්දක්ද? (ල. 2 x 8 = 16)

02. (i) ජේසුස් වහන්සේගේ මව සහ පියා කවුද? (ල. 02)
  (ii) ජේසුස් වහන්සේ බැහැදැකීමට පැමිණි ශාත්‍රවන්තයින් රැගෙන ආ දේවල් 03 ක් සඳහන් කරන්න. (ල. 03)
  (iii) කිතු උපත සැමරීමේ දී අප කළ යුතු යහපත් ක්‍රියා 03 ක් ලියන්න. (ල. 06)

03. (i) ජේසුස් වහන්සේට පැමිණි පරීක්ෂා ගණන කීයද? (ල. 02)
  (ii) එම පරීක්ෂාවන් පිළිවෙළින් ලියා දක්වන්න. (ල. 03)
  (iii) කිතුනු දරුවෙකු ලෙස ඔබගේ ජීවිතයට පැමිණෙන පරීක්ෂාවන් 06 ක් ලියන්න. (ල. 06)

04. (i) ජේසුස් වහන්සේගේ උත්ථානයට සාක්ෂි දැරූ කාන්තාවන් දෙදෙනෙකු නම් කරන්න. (ල. 02)
  (ii) සොහොන වෙත ගිය කාන්තාවන්ට ජේසුස් වහන්සේ ගැන ලද සුපුවත කුමක් ද? (ල. 03)
  (iii) කිතුනු සුබාරංචිය අන් අය වෙත ගෙන යාමට ඔබට කළ හැකි දේවල් 03 ක් ලියන්න. (ල. 06)

05. (i) ජේසුස් වහන්සේ සිය මෙහෙවර ආරම්භ කළේ කිනම් වයසකදී ද? (ල. 02)
  (ii) ස්නාවක ජොහාන් තුමාගේ කාර්යය වූයේ කුමක්ද? (ල. 03)
  (iii) බෞතිස්මය ලැබූ කිතුනු දරුවෙකු ලෙස පාසල තුළ ඔබට කළ හැකි දේවල් 03 ක් ලියන්න. (ල. 06)

06. (i) ජේසුතුමා තම ජීවිතය පූජා කළේ ඇයි ? (ල. 02)
  (ii) සදාතන ජීවිතය ලබා ගැනීමට ඔබ තුළ තිබිය යුතු යහපත් ගුණාංග 03 ක් ලියන්න. (ල. 03)
  (iii) ඔබගේ පාපයට කමාව අයදිමින් කෙටි යැදුමක් ලියන්න. (ල. 06)

07. (i) දේව මැවිල්ලේ නිර්මාතෘ කවුරුන්ද? (ල. 02)
  (ii) දේව මැවිල්ලක් වන ගස්වැල් වලින් ඇති ප්‍රයෝජන 03 ක් ලියන්න. (ල. 03)
  (iii) පරිසරය ආරක්ෂා කිරීමට ඔබට කළ හැකි දේවල් 03 ක් ලියන්න. (ල. 06)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. (2) 02. (4) 03. (1) 04. (3) 05. (3) 06. (✓) 07. (✓) 08. (X) 09. (✓) 10. (X)

11. බර්තිමේයස් 12. විනයධරයා 13. ඉතියෝපිය ජාතිකයා 14. ජේසුස් වහන්සේ 15. දේවදූතයා
16. පිලිප් 17. ඒදන් 18. උත්පත්ති 19. ක්ලේයෝපස් 20. ස්තේපන්

## II කොටස

01. (i) මිනිසා
(ii) අවුරුදු 12 දී
(iii) රෙදි වලින් ඔතා ගවයන් කන ඔරුවක බාවා ඇති බිළිඳෙකු
(iv) මොහු ජුදෙව්වන්ගේ රජ ජේසුස් / මොහු ජුදෙව්වරුන්ගේ රජ
(v) පාස්කු ඉරිදා
(vi) පෙන්තකොස්ත දිනයේ
(vii) දෙවියන් වහන්සේ මෝසෙස් මගින් ඊශ්‍රායෙල් සෙනඟ වහල්කමින් මුදවා පොරොන්දු දේශයට ගෙනයාම.
(viii) ජේසු කුමරු විසින් මරියතුමියට (ල. 2 x 8 = 16)

02. (i) මරියතුමිය සහ ජුසේතුමා (ල. 02)
(ii) රත්තරන්, තුවරලා හා ගන්ධරස (ල. 03)
(iii) ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න. (ල. 06)

03. (i) 03 යි. (ල. 02)
(ii) ගල්ගෙඩියක් පාන් ගෙඩියක් කරන්න.
සියලු යස ඉසුරු දෙන්නම් යක්ෂයාට නමස්කාර කරන්න.
ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයා නම් දේවමාළිගාවේ කොත මුදුනින් පනිනින්න. (ල. 03)
(iii) ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න. (ල. 06)

04. (i) මද්දලායේ මරියා, ජෝවන්නා, ජාකොබ්ගේ මව වූ මරියා. (ල. 02)
(ii) මරණින් උත්ථාන වූ බව (ල. 03)
(iii) ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න. (ල. 06)

05. (i) අවුරුදු 30 දී (ල. 02)
(ii) ජේසුස් වහන්සේ පිළිගෙන අදහා ගැනීමට ජනතාවගේ හදවත් සූදානම් කිරීම. (ල. 03)
(iii) ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න. (ල. 06)

06. (i) මිනිසාගේ පාපය වෙනුවෙන් (ල. 02)
(ii) පව්වලින් මිදීම ලබා ගැනීම හා පසුතැවීම
වැරදි නිවැරදි කර ගැනීම.
අන් අයට උදව් කිරීම ආදිය.... (ල. 03)
(iii) ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න. (ල. 06)

07. (i) දෙවියන් වහන්සේ (ල. 02)
(ii) ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න. (ල. 03)
(iii) ගස්වැල් සිටුවීම, අවශ්‍ය පෝෂ්‍ය ලබා දීම ආදී නිවැරදි පිළිතුරුවලට ලකුණු ලබා දෙන්න. (ල. 06)